

රාජ්‍යයෙන් අත්හැර දමා, පෞද්ගලික වතු තුළ සිරවී:

ශ්‍රී ලංකාවේ මලෙයහ දෙමළ තේ වතු සේවකයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්

1. විධායක සාරාංශය

මෙම වාර්තාව පදනම්වී ඇත්තේ 2024 ජනවාරි සිට 2026 ජනවාරි දක්වා කාලය තුළ ජාත්‍යන්තර ක්ෂමා ආයතනය විසින් ශ්‍රී ලංකාවේ සිදු කරන ලද පර්යේෂණ මතය. මෙම පර්යේෂණය ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පෞද්ගලික වතු සහ කුඩා වතුවල මලෙයහ දෙමළ තේ වතු සේවකයින් මුහුණදෙන සේවක අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් කෙරෙහි අවධානය යොමු කරයි.

1.1 ක්‍රමවේදය

2024 ජනවාරි සහ පෙබරවාරි මාසවලදී, ජාත්‍යන්තර ක්ෂමා ආයතනය විසින් දකුණු පළාතේ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල පිහිටි පෞද්ගලික වතු සහ කුඩා වතු 45ක (මෙහි සාමුහිකව "වතු" ලෙස හැඳින්වේ) සංචාරයක් සිදු කරන ලදී. මෙම තෝරාගැනීම බිම් මට්ටමේ සංවිධාන, ක්‍රියාකාරීන් සහ මලෙයහ දෙමළ ප්‍රජාවේ සාමාජිකයින්ගේ උපදෙස් මත පදනම් විය; එය සියලුම ශ්‍රී ලාංකික තේ වතු සංඛ්‍යානමය වශයෙන් නියෝජනය කිරීමට අදහස් නොකළේය. පර්යේෂකයින් වතු 45හි සේවකයින් සමඟ සම්මුඛ සාකච්ඡා 154ක් සහ මෙම වතුවලින් පිටත දකුණු පළාතේ වතුවල ජීවත්වූ සහ වැඩ කරන ලද සේවකයින් සමඟ සම්මුඛ සාකච්ඡා පහක් පවත්වන ලදී. පර්යේෂකයින් සේවකයින් 65 දෙනෙකු සමඟ ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා 15ක් ද පවත්වන ලදී. සම්මුඛ සාකච්ඡාවලට ළමුන් හතර දෙනෙකු (අවුරුදු 18ට අඩු) ඇතුළත් විය. සිංහල ලෙස හඳුනාගත් තිදෙනෙකුට අමතරව, සම්මුඛ සාකච්ඡා කළ සේවකයින් මලෙයහ දෙමළ ජාතිකයෝ වූහ. සම්මුඛ සාකච්ඡා බොහොමයක් වතුවල පෞද්ගලික මට්ටමින් සිදු විය. සහභාගිවූවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සේවකයින්ගේ සහ වතුවල අනන්‍යතාව වාර්තාව තුළ හෙළිදරව්කර නොමැත. තවද, පර්යේෂකයෝ වතු කළමනාකරුවන් දෙදෙනෙකු, අධීක්ෂකවරු (කංකාණම්) තිදෙනෙකු, එක් පරිපාලකයෙකු, එක් ක්ෂේත්‍ර නිලධාරියෙකු සහ වෘත්තීය සමිති සාමාජිකයින් දෙදෙනෙකු සමඟද කතා කළහ. ර්යේෂණ ප්‍රශ්න බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය, වහල් ශ්‍රමය, ජීවන සහ සේවා තත්ත්වයන් කෙරෙහි අවධානය යොමු කළේය. සංචාර සිදු කරන අතරතුර, පර්යේෂකයෝ වතුවල ජීවන සහ සේවා තත්ත්වයන් පිළිබඳව තම නිරීක්ෂණ වාර්තාකර ගත්හ.

කම්කරු දෙපාර්තමේන්තුව, පඩි පාලක සභාව, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සහ සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මාතර දිස්ත්‍රික් කාර්යාලයේ නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. එමෙන්ම, දකුණු පළාතේ මලෙයහ දෙමළ සේවකයින් සමඟ සමීපව කටයුතු කරන සිවිල් සමාජ ක්‍රියාකාරිකයෙකු සහ නීතිඥයෙකු සමඟ සම්මුඛ සාකච්ඡා දෙකක්ද පවත්වන ලදී.

1.2 පසුබිම

මලෙයහ දෙමළ ප්‍රජාව 19 වන සියවසේ මුල් භාගයේදී බ්‍රිතාන්‍ය යටත් විජිතවාදීන් විසින් තේ වතුවල වැඩ කිරීම සඳහා ඉන්දියාවේ දකුණු ප්‍රදේශයේ සිට ශ්‍රී ලංකාවට ගෙනඑන ලද සේවකයින්ගෙන් පැවතඑනු ලැබේ. මෙම ප්‍රජාව ශ්‍රී ලංකාවේ වැඩියෙන්ම වෙනස්කොට සැලකීමට සහ අහිමිවීම්වලට ලක්වූ ප්‍රජාවකි. මලෙයහ දෙමළ ජනයා කොන් කිරීම ශ්‍රී ලංකා රජය විසින් ඔවුන්ට පුරවැසිභාවය ඓතිහාසිකව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ඇති වූ අතර, එයට, පෙළපත මත පදනම්ව පුරවැසිභාවය සඳහා කොන්දේසි නියම කළ 1948 පුරවැසි පනත සම්මත කිරීමද ඇතුළත්ය. 2003දී "ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයින්ට" පුරවැසිභාවය ලබාදීමෙන් මෙය අවසානයේ නිවැරදි කරන ලදී, නමුත් දශක ගණනාවක්

නිස්සේ පැවති අයිතිවාසිකම් අහිමි කිරීම, පුරවැසිභාවය නොමැති බව සහ ඉඩම් හිමිකාරිත්වයට ඇති බාධක නිසා, මෙම ප්‍රජාවට කල් පවත්නා අන්තර්පරම්පරා ප්‍රතිවිපාක ඇතිකර තිබේ.

මලෙයහ දෙමළ ප්‍රජාව පෙළපත මත පදනම් වූ පද්ධතිමය වෙනස්කොට සැලකීම්වලට මුහුණදෙමින් සිටින අතර, එය ශ්‍රමය සූරාකෑමට ඔවුන් ගොදුරුවීමේ අවදානමට සෘජුවම දායක වේ. විශේෂයෙන් සෞඛ්‍ය සේවා වැනි රජයේ සේවාවන් වෙත ප්‍රවේශවීමේදී, මෙම ප්‍රජාව අඛණ්ඩව සිදුවන පද්ධතිමය බැහැරකිරීම් නිසා බලපෑමට ලක්වෙයි. එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රජාව හුදකලාවී සිටින අතර, ජීවනෝපාය සහ නවාතැන් සඳහා පමණක් නොව, සුබසාධනය සඳහාද ඔවුන්ගේ සේවායෝජකයින් මත දැඩි ලෙස යැපීමට සිදුව ඇත.

තේ අපනයනය ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම අපනයන ආදායම ලබාදෙන ප්‍රභවය වුවද, එහි ප්‍රතිලාභය ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනයේ කොදු නාරටිය වන මලෙයහ දෙමළ සේවකයින් වෙත ළඟාවී නොමැත. ශ්‍රී ලංකාවේ තේ නිෂ්පාදනය වතු සමාගම් සහ රාජ්‍ය සංස්ථා විසින් කළමනාකරණය කරනු ලබන වතුවල මෙන්ම, පෞද්ගලික අයිතිය ඇති වතු සහ කුඩා වතුවලද සිදු වේ. මෙම පර්යේෂණයේ අවධානය යොමුකර ඇත්තේ පෞද්ගලික වතු සහ කුඩා වතු කෙරෙහිය.

1.3 නෛතික රාමුව

ශ්‍රී ලංකාව සියලුම මූලික ජාත්‍යන්තර මානව හිමිකම් ගිවිසුම් අපරානුමතකර ඇත. 1948 සිට ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) සාමාජිකයෙකුවන අතර, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් 43ක්ද අපරානුමතකර ඇත. මෙයින් අදහස් කරන්නේ සේවායෝජකයින් ඇතුළුව, රාජ්‍ය නොවන ක්‍රියාධරයින් සහ පෞද්ගලික පුද්ගලයින් විසින් සිදුකරන වෙනස්කොට සැලකීම් සහ මානව හිමිකම් උල්ලංඝනයන්ගෙන් මලෙයහ දෙමළ සේවකයින් ආරක්ෂා කිරීම කෙරෙහි ශ්‍රී ලංකාවට පැහැදිලි බැඳීම් ඇති බවයි.

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සියලුම පුරවැසියන්ට සමානාත්මතාව සහ වෙනස්කොට නොසැලකීමේ අයිතිය සහ කථනයේ, සමාගමයේ, සංවිධානය වීමේ, රැකියාවක නිරත වීමේ සහ එහාමෙහා යාමේ නිදහස ඇතුළු සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් සහතික කරයි. යම්තාක් දුරට, වතු සේවකයින් රටේ සාමාන්‍ය කම්කරු නීති මඟින් ආරක්ෂාකර ඇති නමුත්, වැටුප්, සේවා තත්ත්වයන් සහ වෘත්තීය සහ සෞඛ්‍ය ආරක්ෂාව සම්බන්ධයෙන් වතුවලට විශේෂිත වූ ආරක්ෂාවන්හි සැලකිය යුතු අඩුපාඩු තිබේ. කම්කරු නීති උල්ලංඝනය කිරීම් සහ සාපරාධී ක්‍රියාවන් ආමන්ත්‍රණය කිරීම සඳහා ශක්තිමත් නීති රාමුවක් සහ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියක් න්‍යායාත්මකව ඇතත්, ව්‍යුහාත්මක අසමානතාව සහ ශ්‍රමය සූරාකෑමේ ක්‍රමවේදයන් සහිත සන්දර්භයක් තුළ, වතු සේවකයින්ට මෙම පද්ධතියට ප්‍රවේශ වීම අතිශයින්ම අභියෝගාත්මකය.

1.4 බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය

මලෙයහ දෙමළ සේවකයින්ගෙන් බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය ඇතුළුව, විවිධ මානව හිමිකම් උල්ලංඝනයන් අත්විඳින බව පර්යේෂණයෙන් හෙළිදරව් විය. මෙය ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර නීතිය යටතේ ඇති බැඳීම්වලට පටහැනිය. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය අර්ථ දක්වන්නේ සේවකයා "ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වී නොමැති" විටක "ඕනෑම දඩුවමක් දීමේ තර්ජනය යටතේ ගනු ලබන" වැඩ ලෙසය. බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය පිළිබඳ

නිශ්චිත දර්ශක ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් හඳුනාගන්නා අතර, ඒවාට අවදානම්භාවය අනිසි ලෙස භාවිත කිරීම, බිය ගැන්වීම් සහ තර්ජන, ශාරීරික හා ලිංගික ප්‍රචණ්ඩත්වය, වහල් ශ්‍රමය, එහාමෙහා යාම සීමා කිරීම සහ නින්දා සහගත වැඩ කිරීමේ සහ ජීවන තත්ත්වයන් ඇතුළත්වේ. මේ සියල්ල පර්යේෂණය අතරතුර මලෙයහ දෙමළ සේවකයින්ගේ අත්දැකීම් තුළ ලේඛණගත කර ඇත. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සාමාජිකයින් බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය භාවිත කිරීම මර්දනය කිරීමට සහ ඒ සඳහා දඬුවම් කිරීමට ඵලදායී පියවර ගැනීමට බැඳී සිටී.

අවදානම්භාවය අනිසි ලෙස භාවිත කිරීම බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමයේ ප්‍රධාන දර්ශකයකි. මලෙයහ දෙමළ ප්‍රජාව දිගු කලක් තිස්සේ පෙළපත, ජනවාර්ගික සම්භවය, කුලය සහ භාෂාව මත පදනම්ව ඓතිහාසික, පද්ධතිමය සහ ව්‍යුහාත්මක වාර්ගික වෙනස්කොට සැලකීම් අත්විඳ ඇති අතර, එමඟින් ඔවුන් බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමයට ගොදුරුවීමේ අවදානමට ලක්ව ඇත. පෞද්ගලික තේ වතු සහ කුඩා වතුවල සේවායෝජකයින් කුලය මත පදනම් වූ වෙනස්කොට සැලකීම ඇතුළුව, මලෙයහ දෙමළ අනන්‍යතාවයට සම්බන්ධ අවදානම්භාවයන් අනිසි ලෙස භාවිත කළ ආකාරය ජාත්‍යන්තර ක්ෂමා ආයතනයෙහි විමර්ශනයෙන් පෙන්නුම් කෙරේ.

මලෙයහ දෙමළ ප්‍රජාව මුහුණදෙන අභියෝග සහ අවදානම, පොදුවේ ඉඩම් නොමැතිකම මඟින් සංකීර්ණකර ඇති අතර, එයින් අදහස් කරන්නේ බොහෝ දෙනෙකුට ඉඩමක් හෝ ඉඩම් හිමිකමක් නොමැති බවයි. සේවකයින්ගේ නිවාස වතු තුළ ඇති ඔවුන්ගේ රැකියාවට බැඳී ඇති බව පර්යේෂණයෙන් හෙළි විය. රැකියාව සඳහා පමණක් නොව නිවාස සඳහාද වතු කළමනාකරණය මත පවතින මෙම බහුවිධ යැපීම, සේවකයින් අපයෝජනයට සහ බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමයට ගොදුරුවීමේ අවදානම තවත් වැඩි කරයි. බැහැදැකීමට ගිය වතු 45 තුළම, සේවකයින් පැවසුවේ නිවාස සඳහා තම සේවායෝජකයා මත යැපෙන බවයි. බලහත්කාරයෙන් ඉවත් කිරීම පිළිබඳ බිය සහ උගුලකට හසුවූ ආකාරයේ හැඟීම නිසා සේවකයින් අවදානම් සහගත තත්ත්වයකට සහ දුර්වල ජීවන සහ සේවා තත්ත්වයන්ට අභියෝග කිරීමට නොහැකි තත්ත්වයකට පත්කර ඇත.

බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීමේ තවත් ප්‍රධාන දර්ශකයක් වන්නේ ශාරීරික හා ලිංගික අපයෝජනයයි. වතු 15ක සේවකයින් ජාත්‍යන්තර ක්ෂමා ආයතනය වෙත පැවසුවේ වතු කළමනාකාරිත්වය වෙතින් සේවකයින් වාචික සහ/හෝ ශාරීරික අපයෝජනයන්ට ලක්ව ඇති බව හෝ ඒවා දැක ඇති බවයි. වත්ත විවේචනය කිරීම, රැකියාවට නොපැමිණීම, ප්‍රමාද වීම සහ නොගෙවූ වැටුප පිළිබඳව විමසීම ඊට හේතු විය. බිය ගැන්වීමේ උපක්‍රමයක් ලෙස ශාරීරික ප්‍රචණ්ඩත්වයේ තර්ජනද භාවිත කළ බව වාර්තා විය. තවද, ලිංගික අපයෝජන අත්විඳින බව සේවකයෝ වාර්තා කළහ.

මලෙයහ දෙමළ සේවකයෝ දරිද්‍රතාවයෙන් ජීවත්වෙති. එහි ප්‍රතිඵලයක් ලෙස වහල් ශ්‍රමය, සහ නිවාස, සෞඛ්‍ය සේවා සහ අනෙකුත් අත්‍යවශ්‍ය අවශ්‍යතා සඳහා පෞද්ගලික වතු සහ කුඩා වතු මත යැපීම ඇතුළුව, ආර්ථික අවදානම් ඇති වේ. වහල් ශ්‍රමය යනු බලහත්කාරයෙන් ලබා ගන්නා ශ්‍රමයේ දර්ශකයක් මෙන්ම, එහි එක් ආකාරයක්ද වේ. වහල් ශ්‍රමයෙහි ප්‍රතිඵලයක් ලෙස, පරම්පරා ගණනාවක් පුරාවට පවා අවිනිශ්චිත කාලයක් තුළ සේවකයින් සේවායෝජකයෙකුට බැඳී සිටිය හැකිය. යථාර්ථවාදී නොවන දෛනික තේ නෙළීමේ ඉලක්ක සහ වැටුප් අඩු කිරීම් සම්බන්ධයෙන් විනිවිදභාවයක් නොමැතිකම ඇතුළුව, සේවකයින්ට දෛනික අවම වැටුප ලැබීම වළක්වන උපක්‍රම භාවිත කිරීමෙන්, ආහාර සහ ඖෂධ ඇතුළු මූලික දෛනික වියදම් සපුරාගැනීම සඳහා වැටුප් අත්තිකාරම් සහ ණය මත යැපීමට වතු කළමනාකාරිත්වයන් කම්කරුවන්ට බල කරන බව පර්යේෂණයෙන් හෙළිදරව් විය. දෛනික අවම වැටුප්

අත්හිටුවීම, නීති විරෝධී වැටුප් අඩු කිරීම්, අර්ථ දැක්වීම් නොකළ ආපසු ගෙවීමේ නියමයන් සහ අධික ලෙස ඉහළ දමා ඇති සිල්ලර බඩු මිල ගණන් නිසා, වතු හිමියන් කෙරෙහි ඇති ණය ක්‍රමක්‍රමයෙන් වැඩිවන නිමක් නැති චක්‍රයක් තුළට සේවකයින් බලෙන් ස්ථානගත කරන බව පර්යේෂණයෙන් හෙළිවිය. මෙය ඔවුන්ව වතු හිමියන්ගේ පාලනය යටතේ තබමින්, සමහර විට පරම්පරා ගණනාවක් පුරා, වහල් ශ්‍රමයට සමාන විය හැකි තත්ත්වයකට ඔවුන් පත්කරයි.

අවම වශයෙන් වතු 22ක සේවකයෝ තම එහාමෙහා යාමේ නිදහස කෙරෙහි වතු කළමනාකරණය විසින් පනවා ඇති සීමාවන් විස්තර කළහ. මෙම සීමාවන් වතුයායෙන් වතුයායට වෙනස් වූ අතර, යම් නිශ්චිත කාලයකට පසු වත්තෙන් පිටව යාමට නොහැකි වීම, පෞද්ගලික රාජකාරියක යෙදීමට හෝ අනුමැතියකින් තොරව හෝ පවුලේ සියලුම සාමාජිකයින් සමඟ ගමන් කිරීමට අවසර නොදීම, ගමන් කාලය පිළිබඳ සීමාවන් තිබීම සහ ඔවුන්ගේ ගමනාන්තය කළමනාකාරිත්වයට දැනුම්දීමට සිදුවීම ඇතුළත් විය. නිදහසේ එහාමෙහා යාම කෙරෙහි පනවන එවැනි සීමා කිරීම්, අත්තනෝමතික මැදිහත්වීමකින් තොර පවුල් ජීවිතයකට ඇති අයිතිය මෙන්ම, අධ්‍යාපනයට ඇති අයිතිය වැනි අනෙකුත් මානව හිමිකම් ක්‍රියාත්මක කිරීම සහ භුක්ති විඳීම කෙරෙහි බලපෑම් කළ හැකිය. පවුලේ එක් සාමාජිකයෙකු හෝ වතුයායේ රැඳී සිටිය යුතුයැයි වතු විසින් නියම කරන ආකාරය සේවකයෝ විස්තර කළහ. එසේ නොකළහොත්, ඔවුන් පලායනු ඇතැයි බියක් තිබුණි. තම දරුවන් පාසල් යැවීමට අවසර නොදෙන බවද දෙමාපියෝ වාර්තා කළහ.

මලෙයහ දෙමළ සේවකයින් නින්දා සහගත වැඩ කිරීමේ සහ ජීවන තත්ත්වයන්ට නිරාවරණය වන අතර, එය බලහත්කාරයෙන් ලබා ගන්නා ශ්‍රමය පිළිබඳ තවත් දර්ශකයකි. ශ්‍රී ලංකාවේ තේ වතු සේවකයින් අස්ථිර සේවා තත්ත්වයන්ට මුහුණදෙන බවට පවතින සොයාගැනීම් මෙම පර්යේෂණයෙන් තහවුරු විය. සම්මුඛ පරීක්ෂණවලට සහභාගිවූවෝ පෞද්ගලික ආරක්ෂක උපකරණ නොමැතිකම සහ ඔවුන් වැඩ කරන අතරතුර ඇති වූ තුවාල පිළිබඳව විස්තර කළහ. වතු සේවකයින්ගේ වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂක ගැටළු ඉලක්ක කරගත් ජාතික ප්‍රතිපත්තියක් හෝ නීති සම්පාදනයක් දැනට නොමැත. තවද, මලෙයහ දෙමළ වතු සේවකයින්ගේ ජීවන තත්ත්වයන් ප්‍රමාණවත් නිවාස සඳහා ඇති අයිතියෙහි ප්‍රධාන අංග සපුරාලීමට අපොහොසත් වේ. සේවා කාලයෙහි සුරක්ෂිතතාවක් නොමැතිකමට අමතරව, සේවකයින්ට ලබාදී ඇති නිවාසවල ප්‍රමාණවත් ඉඩකඩ, කාලගුණයට ඔරොත්තු දෙන යටිතල පහසුකම් සහ ප්‍රමාණවත් සනීපාරක්ෂාවක්ද නොමැත.

1.5 සමාජ ආරක්ෂණය කෙරෙහි ඇති අයිතිය

ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ පර්යේෂණයෙන් මලෙයහ දෙමළ සේවකයින්ට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ කෙරෙහි ඇති ප්‍රවේශයෙහි සැලකිය යුතු අඩුපාඩු අනාවරණය විය. මෙය ශ්‍රී ලංකාවේ මානව හිමිකම් බැඳීම්වලට පටහැනි වන අතර, එම බැඳීම්වලට අනුව රාජ්‍යයන්ට සමාජ ආරක්ෂණ අයිතියට ගරු කිරීමට, ආරක්ෂා කිරීමට සහ සපුරාලීමට බැඳීමක් ඇත. සියලුම ප්‍රජාවන්ට මෙම අයිතිය භුක්ති විඳිය හැකි බව සහතික කිරීම සඳහා පියවර ගැනීමද මෙයට ඇතුළත් වේ. සේවකයින් වාර්තා කළේ ඔවුන්ට මාතෘ ප්‍රතිලාභ, විශ්‍රාම වැටුප් හෝ අසනීප නිවාඩු සඳහා ප්‍රවේශයක් නොමැති බවයි. පෞද්ගලික වතු සහ කුඩා වතුවල සේවායෝජකයින් හිතාමතාම සහ සාවද්‍ය ලෙස මලෙයහ දෙමළ සේවකයින් "අනියම් සේවකයින්" ලෙස වර්ගීකරණය කරන අතර, එමඟින් සියලුම ශ්‍රමය සම්බන්ධ නෛතික හිමිකම් සහ මූලික ව්‍යවස්ථාමය ප්‍රතිලාභවලින් ඔවුන් ඉවත් කරනු ලබයි. මලෙයහ දෙමළ වතු සේවකයින් සම්බන්ධයෙන් පැහැදිලිවම සිදුවන පරිදි - සේවකයා පාලනය කිරීමට සේවායෝජකයෙකු බලය තමා

සතුව තබාගන්නා විට, එවැනි පුද්ගලයෙකු ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු ලෙස සැලකිය නොහැකි බව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය තහවුරුකර ඇත. මලෙයහ දෙමළ සේවකයින් "අනියම්" සේවකයින් ලෙස සූරාකෑමේ වැරදි වර්ගීකරණයෙන් අදහස් වන්නේ, වෙනත් දේ අතර, කාන්තා සේවිකාවන් මාතෘ ප්‍රතිලාභවලින් බැහැරකර ඇති බවයි.

ශ්‍රී ලංකාවේ, සේවායෝජකයින් විසින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා දායක මුදල් ගෙවිය යුතු අතර, එය විශ්‍රාම ගැනීමෙන් පසු සේවකයින්ට ප්‍රතිලාභ ලබාදෙන ශ්‍රී ලංකාවේ සමාජ ආරක්ෂණ පද්ධතියේ කොටසකි. වතු සේවකයින්ට විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගැනීම ප්‍රතික්ෂේප කරන බව පර්යේෂණයෙන් හෙළි විය. සේවායෝජකයින් තම සේවකයින් සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ලියාපදිංචි කළ යුතු වේ. මෙම ප්‍රතිලාභ සඳහා ලියාපදිංචිවී තිබේද යන්න පිළිබඳව අවිනිශ්චිත බවක් හෝ ලියාපදිංචිකර නොමැති බවට සේවකයෝ වාර්තා කළහ. ඔවුන් වෙනුවෙන් තැන්පත් කරනු ලබන දායක මුදල් (සහ ඊට අනුරූප වැටුප් අඩු කිරීම්) පිළිබඳව, විනිවිද බවින් යුතු වාර්තා සේවකයින්ට නොතිබූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට විශ්‍රාම යාමේදී ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ලබාගත හැකිද යන්න පැහැදිලි නොවේ. මලෙයහ දෙමළ වතු සේවකයින්ට වැටුප් සහිත අසනීප නිවාඩු සඳහා ප්‍රවේශය නොමැති බවද පර්යේෂණයෙන් ඉස්මතු විය. අසනීප වූ විටද අඛණ්ඩව වැඩ කිරීම අපේක්ෂා කරන බව සේවකයෝ වාර්තා කළහ.

ජාත්‍යන්තර ක්ෂමා ආයතනයෙහි පර්යේෂණයෙන් පෙනීයන්නේ, තේ වතු සේවකයින් සඳහා වෘත්තීය සමිති කෙරෙහි ඇති ප්‍රවේශය ඉතා සීමිත බවත්, බොහෝ විට සම්පූර්ණයෙන්ම නොමැති බවත්, හෝ ඔවුන්ගේ සේවායෝජකයින් විසින් තහනම්කර ඇති බවත්ය. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, නීති රීති සහ ජාත්‍යන්තර බැඳීම් යටතේ වෘත්තීය සමිතිවලට සම්බන්ධ වීම සහ පිහිටුවීම සීමා කිරීම නීති විරෝධී වේ. පර්යේෂණය අතරතුර බැහැදැකීම් කරන ලද වතු, වෘත්තීය සමිති පිළිබඳ අදහසට විරුද්ධ වූ අතර ක්‍රියාත්මක වන වෘත්තීය සමිති ඒවායෙහි නොතිබුණි. වෘත්තීය සමිති නොමැතිකම සහ මලෙයහ දෙමළ සේවකයින් අත්විඳින අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් වැඩිවීම අතර සහසම්බන්ධයක් ඇති බව තමාට හැඟෙන බව වෘත්තීය සමිති ක්‍රියාකාරිකයෙකු ක්ෂමා ආයතනය වෙත පැවසීය.

1.6 ශ්‍රමය පරීක්ෂාව සහ අධීක්ෂණය

මාතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල තේ වතුවල ශ්‍රමය පරීක්ෂා කිරීම් සහ සේවා නියුක්තියෙහි ප්‍රමිතීන් බලාත්මක කිරීමේදී සැලකිය යුතු අසාර්ථකත්වයන් මෙම පර්යේෂණයෙන් සොයාගන්නා ලදී. කම්කරු අමාත්‍යාංශය තුළ පිහිටා ඇති කම්කරු දෙපාර්තමේන්තුව, සුපරීක්ෂණයන් හරහා වැඩ කරන වේලාවන්, වැටුප්, ප්‍රතිලාභ සහ සේවා තත්ත්වයන් වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ කම්කරු නීති බලාත්මක කිරීමේ වගකීම දරයි. කම්කරු දෙපාර්තමේන්තුව පර්යේෂකයින්ට පැවසුවේ නිතිපතා පරීක්ෂාවන් පවත්වන බවයි, නමුත් වතු සේවකයින් සම්බන්ධයෙන් ඔවුන්ගේ ලියකියවිලි නොමැතිකම සහ භාෂා බාධකය නිශ්චිත අභියෝග මතු කරන බව අවධාරණය කළේය. නිලධාරීන් වතුවලට පැමිණෙන්නේ කලාතුරකින් බවත්, තමන්ගේ දුක්ගැනවිලි තවමත් නිරාකරණයවී නොමැති බවත් සේවකයෝ වාර්තා කළහ.

1.7 යුක්තිය සඳහා ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ ශක්තිමත් නීති රාමුවක් තිබියදීත්, යුක්තිය කෙරෙහි ප්‍රවේශ වීමේදී හෝ අපයෝජන හෝ දුර්වල සේවා තත්ත්වයන් වෙනුවෙන් පිළියම් ලබාගැනීමේදී මලෙයහ දෙමළ සේවකයෝ බහුවිධ

අභියෝගවලට මුහුණදෙති. භාෂාව, භූගෝලීය වශයෙන් පවතින දුර, වැටුප් අහිමිවීම නිසා පැමිණිලි සම්බන්ධව පසුවිපරම් කිරීම සඳහා රැකියාවෙන් නිවාඩු ගැනීමට නොහැකිවීම, පොලිසිය ඇතුළු රාජ්‍ය නිලධාරීන් විසින් වෙනස්කොට හෝ අගතිගාමී ලෙස සැලකීම, සහ ඔවුන්ගේ රැකියාවට අදාල ලියකියවිලි සඳහා ප්‍රවේශය නොමැතිකම මේවාට ඇතුළත් වේ. පැමිණිලි ආමන්ත්‍රණය කිරීම සඳහා වන බලයෙන් වැඩි ප්‍රමාණයක් පොලිසිය සතු අතර, ඔවුන් පිළියම් සොයන මලෙයහ දෙමළ සේවකයින් සමඟ කටයුතු කිරීමේදී සහයෝගය නොදක්වන බව සහ අගතිගාමී වූ බව වාර්තා වේ. නිරන්තරයෙන් කොන්කිරීමට ලක්වීම සහ පද්ධතිමය වෙනස්කොට සැලකීම, පෞද්ගලික වතු සහ කුඩා වතුවල අඛණ්ඩව පවතින බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය සහ අසාධාරණ ශ්‍රම පිළිවෙත්වලට එරෙහිව එලදායී පිළියම් සඳහා පොලීසිය, කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු විනිශ්චය සභාව වැනි ආයතන සහ බෙරුම්කරණය වෙත සේවකයින්ගේ ප්‍රවේශයට බාධා කරයි.

1.8 නිගමනය සහ නිර්දේශ

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පෞද්ගලික වතු සහ කුඩා වතු සම්බන්ධයෙන් මලෙයහ දෙමළ ප්‍රජාවේ අයිතිවාසිකම් කොතරම් දුරට අවතක්සේරුකර ඇත්ද යන්න ජාත්‍යන්තර ක්ෂමා ආයතනය විසින් කරන ලද පර්යේෂණය මඟින් ඉස්මතු කරනු ලබයි. විශේෂයෙන්, බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය පිළිබඳ දර්ශක රාශියක් පැවැතීම සම්බන්ධයෙන් පර්යේෂණය අවධානය යොමුකළ යුතු කරුණු ඉස්මතු කරයි. සමාජ ආරක්ෂණය, සංගමයේ නිදහස සහ යුක්තිය සඳහා වන ප්‍රවේශය කෙරෙහි ඇති අයිතිය ආරක්ෂා කිරීමට සහ සපුරාලීමට සහ ප්‍රමාණවත් ශ්‍රම අධීක්ෂණය සහ පරීක්ෂාව සහතික කිරීමට රාජ්‍යය ක්‍රියා නොකිරීමද එය ඉස්මතු කරයි. මෙම පර්යේෂණයේ සොයාගැනීම් මත පදනම්ව, ජාත්‍යන්තර ක්ෂමා ආයතනය ශ්‍රී ලංකා රජයට නිර්දේශ ඉදිරිපත් කරන අතර, ඒවා වාර්තාවේ අවසානයේ සම්පූර්ණයෙන්ම ලැයිස්තුගතකර ඇත. නිර්දේශ ලැයිස්තුවට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

- පෞද්ගලික වතු සහ කුඩා වතුවල සේවක අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ ස්වභාවය සහ ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා ඉලක්කගත විශේෂ ශ්‍රම පරීක්ෂාවකට වහාම මුලපිරීම.
- විමර්ශන, අපරාධ නඩු පැවරීම් සහ උචිත සිවිල් නඩු කටයුතු සඳහා සහයෝගය දැක්වීම සහ නීතියෙන් පනවන ලද දඬුවම් දැඩි ලෙස බලාත්මක වන බව සහතික කිරීම.
- සුදුසු නිවාස ඇතුළුව, සමාජ-ආර්ථික අයිතිවාසිකම් ලබාගැනීමේදී මලෙයහ දෙමළ ප්‍රජාව මුහුණදෙන බාධක හඳුනාගෙන ඒවා ආමන්ත්‍රණය කිරීමට අදාල රාජ්‍ය බලධාරීන් ක්‍රියාකාරී පියවර ගන්නා බව සහතික කිරීම.

නිගමනය සහ නිර්දේශ

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පෞද්ගලික වතු සහ කුඩා වතුවල මලෙයහ දෙමළ ප්‍රජාවේ අයිතිවාසිකම් කොතරම් දුරට අවතක්සේරුකර ඇත්ද යන්න, ජාත්‍යන්තර ක්ෂමා ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණය මඟින් ඉස්මතු කරයි. විශේෂයෙන්, බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය පිළිබඳව පවතින බොහෝ දර්ශකවල ව්‍යාප්තිය පිළිබඳව ප්‍රශ්න මතු කරයි. සමාජ ආරක්ෂණය, සංගමයේ නිදහස සහ යුක්තිය සඳහා වන ප්‍රවේශය කෙරෙහි ඇති අයිතිය ආරක්ෂා කිරීමට සහ සපුරාලීමට, සහ ප්‍රමාණවත් ලෙස ශ්‍රම අධීක්ෂණය සහ පරීක්ෂාවන් සහතික කිරීමට රාජ්‍යය තුළ ඇති අසමත්වීම්ද එය ඉස්මතු කරයි.

පෞද්ගලික වතු සහ කුඩා වතුවල කම්කරුවන් මුහුණදෙන මලෙයහ දෙමළ අනන්‍යතාව මත පදනම් වූ විවිධ අංශ අතර පවතින, කුලය පාදක කොටගත් වෙනස්කොට සැලකීම්ද මෙම වාර්තාව පරීක්ෂාවට ලක්කරයි, එය ආදායම් තත්ත්වය, රැකියාව හා සම්බන්ධ නිවාස මත යැපීම, සීමිත සාක්ෂරතාවය, සහ ක්‍රමයෙන් එක්රැස්වී ඇති ණය තුළින් ප්‍රකාශ වේ. මෙම වෙනස්කොට සැලකීමේ ප්‍රතිඵලයක් ලෙස ඉහළ ගොස් ඇති අවදානම්භාවය සේවායෝජකයින් විසින් සූරාකෑමට ලක්කරමින් මලෙයහ දෙමළ සේවකයින් බලහත්කාර ශ්‍රමයට යටත් කරනු ලබයි. මෙම සේවකයෝ වතු කළමනාකාරීත්වය අතින් වාචික, කායික හා ලිංගික අපයෝජනවලටද ලක්වෙති. නීති විරෝධී වැටුප් අඩු කිරීම්, අර්ථ දක්වා නොමැති ආපසු ගෙවීම් පිළිබඳ නියමයන් සහ අධික ලෙස ඉහළ දමා ඇති ආහාර මිල ගණන් හේතුවෙන් එකතුවී ඇති ණය ආදියෙහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන ණය චක්‍රවලට ඔවුන් සිරවී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස සේවකයන් වහල් ශ්‍රමයට සමාන තත්ත්වයකින් සේවායෝජකයා වෙත බැඳ තබා ඇත. තවද, වතු කළමනාකාරීත්වයන් විසින් වතු මායිමෙන් ඔබ්බට ගමන් කිරීමට සේවකයින්ට ඇති නිදහසට සීමාවන් පනවා ඇත.

ශ්‍රී ලංකාවේ සේවා නියුක්ති නීතිය යටතේ හිමි ප්‍රතිලාභ කෙරෙහි ඇති ප්‍රවේශය ප්‍රතික්ෂේප කරමින්, වතු සේවායෝජකයින් නිරන්තරයෙන් තේ වතුවල මලෙයහ දෙමළ සේවකයින්ගේ ශ්‍රමය අනියම් ශ්‍රමය ලෙස භාවිත කරන ආකාරය මෙම වාර්තාවෙන් පෙන්වාදෙයි. මෙම සේවකයින් සේවා නියුක්ති තත්ත්වය සඳහා සුදුසුකම් ලබන සීමාව පැහැදිලිවම සපුරාලන නමුත්, මාතෘ ගෙවීම්, විශ්‍රාම වැටුප් දායක මුදල් සහ අසනීප වෙනුවෙන් ප්‍රතිලාභ, වැනි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ නිරන්තරයෙන් ප්‍රතික්ෂේප කරනු ලබයි.

පර්යේෂණයේ සම්මුඛ සාකච්ඡා අතරතුර ඇසුණු සාක්ෂි මඟින් මාතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල වතුවල මලෙයහ දෙමළ සේවකයින් අත්විඳින දැඩි අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ දුර්වල සේවා තත්ත්වයන් ඉස්මතුකර දැක්වීය. ඔවුන්ගේ අත්දැකීම් රටේ සේවා නියුක්ති සහ අපරාධ නීති පැහැදිලිවම උල්ලංඝනය කරන නමුත්, යුක්තිය කෙරෙහි ප්‍රවේශවීමේදී සේවකයින් විවිධාකාරයේ දුෂ්කරතා අත්විඳින බව පර්යේෂණයෙන් පෙන්නුම් කරයි. ආරවුලක් හෝ පැමිණිල්ලක් සම්බන්ධයෙන් එලදායී පිළියමක් ලබාගැනීම සඳහා වන බාධක, ප්‍රාදේශීය කම්කරු කාර්යාලයෙන් හෝ පොලිසිය වැනි බලධාරීන්ගේ සහයෝගය නොමැතිකම මෙන්ම, දකුණු පළාතේ පෞද්ගලික වතු සහ කුඩා වතුවල ශ්‍රමය ලබාගන්නා තත්ත්වයන් පිළිබඳව එලදායී රාජ්‍ය අධීක්ෂණයක් සහ නියාමනයක් නොමැතිකම මේවාට ඇතුළත් වේ. වතුකරයේ සේවකයින් වෘත්තීය සමිති ක්‍රියාමාර්ගවලට සම්බන්ධවීම නිතර තහනම්කර දඬුවම් කරන බැවින්, වෘත්තීය සමිතියකට සම්බන්ධවීමෙන් හෝ එවැන්නක් ආරම්භ කිරීම මඟින් සේවකයින්ට තම සංගමයේ නිදහස ක්‍රියාත්මක කිරීම සඳහා පවතින අවස්ථා සීමිතය. රාජ්‍ය අධීක්ෂණයක් නොමැතිකම සහ

නීතිමය ක්‍රියාමාර්ගවලට ඇති බාධක නිසා, මලෙයහ දෙමළ සේවක ශ්‍රමය බලහත්කාරයෙන් ලබා ගැනීමේ සහ අපවාදාත්මක සහ නීති විරෝධී සේවා කොන්දේසිවලට ගොදුරුවීමේ අවදානම වැඩි වේ.

මෙම පර්යේෂණයේ සොයාගැනීම් මත පදනම්ව, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් යටතේ ඇති බැඳීම්වලට අනුකූලව, ජාත්‍යන්තර ක්ෂමා ආයතනය ශ්‍රී ලංකා රජය වෙත පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි.

රජය වෙත කෙරෙන නිර්දේශ

කම්කරු අමාත්‍යාංශය

- පෞද්ගලික වතුවල බලහත්කාරයෙන් ලබා ගන්නා ශ්‍රමය භාවිත කිරීම, වහල් ශ්‍රමය, ළමා ශ්‍රමය, ලිංගික හිරිහැර, සහ අනෙකුත් අයිතීන් උල්ලංඝනය කිරීමේ ස්වභාවය සහ ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා ඉලක්කගත විශේෂ ශ්‍රම පරීක්ෂාවක් ක්ෂණිකව ආරම්භ කළ යුතුය. මෙම පරීක්ෂාව දකුණු පළාතේ පෞද්ගලික අයිතිය ඇති වතු සහ කුඩා වතුවලින් ආරම්භකර, අනෙකුත් වතුකර ප්‍රදේශවලටද ව්‍යාප්ත කළ යුතුය.
- පරීක්ෂණවලදී හඳුනාගත් ඕනෑම සැක සහිත දණ්ඩ නීති සංග්‍රහයට එරෙහි වැරදි, ව්‍යවස්ථාපිත වගකීම්වලට අනුකූලව, අපරාධ විමර්ශනය සහ නඩු පැවරීම සඳහා ශ්‍රී ලංකා පොලිසියට සහ නීතිපති කාර්යාලයට වහාම යොමු කරන බවට සහතික කිරීම.
- ත්‍රෛපාර්ශවික සමාලෝචනය, ප්‍රතිපත්ති පිළිබඳ සංවාදය, සහ අධීක්ෂණය සඳහා පහසුකම් සැපයීමට, විශේෂ පරීක්ෂණයේ සොයාගැනීම්, නිර්දේශ සහ සැලසුම් කළ පසුවිපරම් ක්‍රියාමාර්ග ජාතික කම්කරු උපදේශක සභාවට ඉදිරිපත් කිරීම.
- දකුණු පළාතේ පෞද්ගලික වතු සහ කුඩා වතු සම්බන්ධයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ නිතිපතා කළ යුතු ශ්‍රම පරීක්ෂා කාර්යයන් ශක්තිමත් කිරීම. මේ සඳහා:
    - වැඩිපුර පරීක්ෂකවරුන් සේවයේ යොදවා පුහුණු කිරීම;
    - මලෙයහ දෙමළ ප්‍රජාව කෙරෙහි අවධානය යොමු කරමින්, පරීක්ෂා ක්‍රියාවලියේදී උල්ලංඝනයන් හඳුනාගැනීමට හැකිවන පරිදි, වහල් ශ්‍රමය ඇතුළුව බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමයට අදාල දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් පිළිබඳව කම්කරු නිලධාරීන් පුහුණු කිරීම;
    - පරීක්ෂා වාර ගණන වැඩි කිරීම, විශේෂයෙන් පූර්ව නිවේදන රහිතව සිදු කරන පරීක්ෂාවන්;
    - දකුණු පළාතේ පෞද්ගලික වතු සහ කුඩා වතුකර ප්‍රදේශ තුළ ඇති කම්කරු කාර්යාල තුළ, ඉහත පරීක්ෂාවන්ට සහභාගී වීම සඳහා දෙමළ භාෂාව කතා කරන පිරිමි සහ කාන්තා නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටින බව සහතික කිරීම.
- විශේෂයෙන්, සිදුවිය හැකි සාපරාධී වැරදි, ළමා ශ්‍රමය පිළිබඳ ගැටළු හෝ විවිධ අංශ හරහා ඇති නියාමන ගැටළු හඳුනාගෙන ඇති තැන්වල, කම්කරු නිලධාරීන් විසින් ශ්‍රී ලංකා පොලිසිය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය සහ අනෙකුත් අදාල රජයේ නියෝජිතායතන සමඟ ඒකාබද්ධව සම්බන්ධීකරණය කළ පරීක්ෂාවන් සිදු කරන බවට සහතික කිරීම.

- බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීමේ භාවිතාවන් සහ ඒවාට පිළියම් සහ ආරක්ෂාව ලබාගන්නේ කෙසේද යන්න පිළිබඳව, මලෙයහ දෙමළ ප්‍රජාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- බලහත්කාරයෙන් ලබා ගන්නා ශ්‍රමයට ගොදුරුවීමේ අවදානම ඉහළ යාමට හේතුවන තේ වතුකර ප්‍රදේශවල මලෙයහ දෙමළ ප්‍රජාව කෙරෙහි මුල්බැසගෙන ඇති වෙනස්කොට සැලකීම පිළිබඳව සැලකිල්ලට ගනිමින්, බලහත්කාරයෙන් ලබා ගන්නා ශ්‍රමය පිළිබඳ ජාතික තක්සේරුවක් පැවැත්වීම.
- දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලට පැමිණිලි කිරීමට මලෙයහ දෙමළ සේවකයින්ට ප්‍රමාණවත් සහාය ලැබෙන බව සහතික කිරීම, සහ ගැටළු නොවිසඳී තිබේ නම්, කම්කරු උසාවිය සහ බෙරුම්කරණ ක්‍රියාවලීන් හරහා ඔවුන්ගේ නඩු ඉදිරියට ගෙනයාමට සහ නොගෙවූ වැටුප් ඇතුළුව වන්දි ලබාගැනීමට සහාය වීම.
- තේ වගා කිරීම සහ තේ නිෂ්පාදන වෙළඳාම සඳහා වන වැටුප් මණ්ඩලය සමඟ අදහස් විමසීමෙන්, ප්‍රමාණවත් ජීවන තත්ත්වයකට ප්‍රවේශය සහතික කරන සහ ණය චක්‍ර වළක්වන, ස්ථීර සාධාරණ ජීවන වැටුපක් නීර්ණය කිරීම. මෙය වරින්වර සමාලෝචනයට භාජනයකර, ජීවන වියදමට සහ උද්ධමනයට අනුකූලව වැඩි කළ යුතුය.
- පහත කරුණු ඇතුළුව, වතුවල සිටින මලෙයහ දෙමළ සේවකයින්ට සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ කෙරෙහි ප්‍රවේශය සහතික කිරීම සඳහා ඉලක්කගත පියවර ගැනීම:
    - නීතිපතා පරීක්ෂාවන් හරහා මාතෘ සහ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ කෙරෙහි ඇති ප්‍රවේශය අධීක්ෂණය කිරීම;
    - දකුණු පළාතේ වතුකර ප්‍රදේශවල සියලුම නේවාසික සේවකයින් සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF) සඳහා ලියාපදිංචි කිරීමට සහ විසඳී නොමැති EPF සහ ETF ගැටළු නිරාකරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා ප්‍රචාරණ වැඩසටහන් සහ ජංගම සායන පැවැත්වීම සහතික කිරීම; සහ
    - අසනීප වෙනුවෙන් ප්‍රතිලාභ ලබාදීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසීම.
- විශේෂයෙන්, පරීක්ෂාවන් මඟින් ආවරණය කරන ලද පෞද්ගලික වතු සහ කුඩා වතු සංඛ්‍යාව පිළිබඳව මෙන්ම, ආධාර ලැබූ මලෙයහ දෙමළ වතු සේවකයින්ගේ සංඛ්‍යාව, සහ කලාපය සහ අංශය මත පදනම් වූ දත්ත ඇතුළුව, සිදු කළ පරීක්ෂාවන් පිළිබඳව වෙන් කරන ලද දත්ත වාර්ෂික වාර්තා තුළ ඉදිරිපත් කිරීම.

මහජන ආරක්ෂක අමාත්‍යාංශය

- කම්කරු දෙපාර්තමේන්තුවේ යොමු කිරීම්වලට අනුව හෝ තමන්ගේම අධිකාරිය මත පදනම්ව, බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය, වහල් ශ්‍රමය, ළමා ශ්‍රමය, ශාරීරික හා ලිංගික අපයෝජන හෝ වෙනත් සාපරාධී අපයෝජන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලිසිය කඩිනම් අපරාධ විමර්ශනවලට මුලපිරීම සහතික කිරීම සහ සුදුසු නඩු පැවරීමේ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.
- වතුකර ප්‍රදේශවල සේවය කරන පොලිස් නිලධාරීන් බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය හා සම්බන්ධ උල්ලංඝනය කිරීම් හඳුනාගැනීම සඳහා අවශ්‍ය දැනුම හා කුසලතාවලින් සන්නද්ධ බවට සහතික කිරීම.
- මලෙයහ දෙමළ ප්‍රජාව තුළින් පොලිස් නිලධාරීන් බඳවා ගැනීම.

- බලහත්කාරයෙන් ශ්‍රමය ලබාගැනීම සම්බන්ධ දණ්ඩ නීති සංග්‍රහයේ නිසි විධිවිධාන යටතේ අපරාධකරුවන්ට එරෙහිව චෝදනා ගොනු කිරීම සඳහා නීතිපති කාර්යාලයේ සහාය ලබාගැනීමට පොලිසියට උපදෙස් දීම.
- සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ පැමිණිලි ලබාගැනීම සඳහා පෞද්ගලික වතු සහ කුඩා වතු අවට ඇති පොලිස් ස්ථානවල විශේෂ උපකාරක කවුළුවක් ස්ථාපිත කිරීම.

වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සහ නිවාස ඉදිකිරීම් හා ජල සම්පාදන අමාත්‍යාංශය

- දකුණු පළාතේ මලෙයහ දෙමළ සේවකයින්ට රජයේ නිවාස යෝජනා ක්‍රම හරහා භුක්තියෙහි සුරක්ෂිතතාව සහිතව සුදුසු නිවාස ලබාදීමට කඩිනම් පියවර ගැනීම.
- ප්‍රාදේශීය මට්ටමින් සම්බන්ධීකරණය කරන ලද ප්‍රචාරණය සහ අධීක්ෂණය හරහා සුදුසු නිවාස, ඉඩම්, සනීපාරක්ෂාව, අධ්‍යාපනය සහ අත්‍යවශ්‍ය මහජන සේවාවන් වෙත ප්‍රවේශවීමේදී මලෙයහ දෙමළ ප්‍රජාව මුහුණදෙන බාධක හඳුනාගෙන, ඒවා ආමන්ත්‍රණය කිරීමට අදාල රාජ්‍ය බලධාරීන් ක්‍රියාකාරී පියවර ගන්නා බවට සහතික කිරීම.
- බලහත්කාරයෙන් සිදු කරන සියලු නෙරපා දැමීම් තහනම් කිරීම සහ නෙරපා දැමීමෙන් පසු කිසිවෙකුට නිවාස අහිමි නොවන බවට සහතිකවීම.

අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

- පවතින නීති මඟින් ආවරණය නොවන ව්‍යක්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව වැනි ක්ෂේත්‍ර ඇතුළුව, සේවා තත්ත්වයන් වටා ආරක්ෂාව සැපයීම සහ සුබසාධනය සඳහා වතු සේවකයින්ට විශේෂිත වූ පුළුල් නීතියක් පැනවීම.
- වහල් ශ්‍රමය පිළිබඳ අර්ථ දැක්වීම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන බවත්, එය බලාත්මක කරන බවත් සහතික කිරීම. බලහත්කාරයෙන් ලබාගන්නා ශ්‍රමය අවසන් කිරීම පිළිබඳ අනෙකුත් සියලුම දේශීය නීති සහ භාවිතාවන් අදාල ජාත්‍යන්තර නීති සහ ප්‍රමිතීන් සමඟ අනුකූලතාවයට පත්කිරීම.
- අපරාධ නඩු පැවරීම් සහ උචිත සිවිල් නඩු කටයුතුවලට සහායවීම සහ නීතිය මඟින් පනවන ලද දඬුවම් දැඩිව බලාත්මක කෙරෙන බවට සහතිකවීම.
- ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ සහාය ඇතිව, මලෙයහ දෙමළ ප්‍රජාවට අධිකරණ සහ විනිශ්චය සභා ඇතුළු අධිකරණ පද්ධතියට සමාන ප්‍රවේශයක් සුරක්ෂිතකර දීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා පොලිසිය ඇතුළු සියලුම අදාල රජයේ ආයතන සහ දෙපාර්තමේන්තු, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූලව, කුලය, ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, භාෂාව සහ සමාජ ආර්ථික තත්ත්වය මත පදනම් වූ වෙනස්කොට සැලකීම් ඇතුළුව, විවිධ අංශ අතර පවතින වෙනස්කොට සැලකීම්වලින් මලෙයහ දෙමළ ප්‍රජාවගේ පූර්ණ ආරක්ෂාව සහතික කරන ආකාරයෙන්, ව්‍යවස්ථාපිත සමානාත්මතා සහතික කිරීම් අර්ථ නිරූපණය කිරීම සහ යොදාගැනීම සහතික කිරීම.
- වෙනස්කොට සැලකීම්වලට විරුද්ධ වන පුළුල් නීතියක් පැනවීම තුළින් මලෙයහ දෙමළ ප්‍රජාවන්ට බලපාන ව්‍යුහාත්මක සහ විවිධ අංශ අතර පවතින වෙනස්කොට සැලකීම් තුරන් කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ගැනීම.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

- 1969 අංක 129 දරන කෘෂිකාර්මික ශ්‍රම පරීක්ෂා සම්මුතිය; 1952 අංක 102 දරන සමාජ ආරක්ෂණ (අවම ප්‍රමිති) සම්මුතිය; 1981 අංක 155 දරන වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ සම්මුතිය; සහ 2006 අංක 187 දරන වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍ය සම්මුතිය සඳහා වන ප්‍රවර්ධන රාමුව අනුමතකර ක්‍රියාවට නැංවීම.

මානව හිමිකම් කොමිෂන් සභාව

- තෙවන පාර්ශවයන් විසින් සිදු කරන මානව හිමිකම් උල්ලංඝනවලින් පුද්ගලයින් ආරක්ෂා කිරීම සඳහා ඇති රාජ්‍ය බැඳීම මත පදනම්ව, පෞද්ගලික ක්‍රියාධරයින් විසින් සිදුකරන අපයෝජන ආවරණය කිරීම සඳහා කොමිෂන් සභාවේ වරම පුළුල් කිරීම මඟින්, මෙම වාර්තාවේ ඉදිරිපත්කර ඇති උල්ලංඝනයන් විමර්ශනය කිරීම සඳහා කරුණු සෙවීමේ මෙහෙයුමක් පැවැත්වීම.
- එම මෙහෙයුමේ සොයාගැනීම් ප්‍රකාශයට පත්කර, අවශ්‍ය පරිදි උචිත පසුවිපරම් ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.